## පෙරපාසල් දරුවන්ගේ ගුරුමෑණිවරුනි

රටට හොද පුරවැසියන් බිහිකරලීම උදෙසා  දරුවන් සමාජයට හුරුකරලීම ආරම්භ කරන ස්ථානයක්වන පෙරපාසල් හරහා රටට ඉතා වටිනා සේවයක් කරන ඔබතුමියන්හට ප්‍රථමයෙන්  කෘතඥතාව පලකර සිටිමි.

**දරුවන් අනාගතයේ දී දුම්වැටි, ගංජා උරන්නන්, මද්‍යසාර භාවිතා කරන්නන් බවට පත්වීම වළක්වා ගැනීමේ අරමුණින් ADIC ආයතනය සමග ක්‍රියාත්මක කරන වැඩසටහන යටතේ  පෙරපාසල් දරුවන්ට  නිවැරදි අවබෝධය කුඩාකල සිට ම ලබා දී ශක්තිමත් කිරීම නොනවත්වා සිදුකරන මෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.**

**පෙරපාසල් දරුවන් සදහා කවි ගායනය හරහා**

සිගරට් බිව්වම තොල් කැතවෙනවා /ගඳ ගහනවා /මුහුණ  කැතවෙනවා /ලස්සන නැතිවෙනවා /ඇස් කැතවෙනවා අරක්කු බිව්වම  මුහුණ  කැතවෙනවා /ගඳ ගහනවා /තොල් කැතවෙනවා/ ලස්සන නැතිවෙනවා /ඇස්  කැතවෙනවා යන මේ කරුණු ගැන දරුවන්ට කියලා දෙන්න.

## දරුවන් සමග ක්‍රියාත්මක වීමට පෙර සූදානම්වීම:

■ මෙහි සදහන් කරුණු පිළිබඳව පෙරපාසල් ගුරුවරුන් වන ඔබ  නිතර මතකයේ තබාගන්න.

■ එක් අවස්ථාවකදී එක් කවියක් පමණක් දරුවන්ට කියා දෙන්න වසර අවසන්වන විට කවි සියල්ල කියාදී අවසන් කරන්න.

■ පෙරපාසල් දරුවන්ට දේශන නොපවත් වන්න.

■ මෙම කවි දරුවන්ට කියා දීමේදී අරක්කු බොන ,සිගරට් බොන ලෙසට රඟ දැක්වීම් නොකරන්න.

■ අප ලබාදෙන නිර්මාණයන්ට අමතර වෙනත් නිර්මාණයන් සිදුකරනවා නම් ඒවා අප වෙත ලබාදී ඒවා සුදුසු පරිදි සකසා නොගෙන දරුවන්ට කියා නොදෙන්න.



■ සිගරට් එකක් හෝ අරක්කු බෝතලයක් පින්තූරයක් ලෙස ඇද දරුවන්ට පෙන්වීම හෝ එලෙස අදින ලද පින්තූර කතිරයකින් කපා දරුවන්ට පෙන්වීම හෝ දරුවන් හරහා එවැනි පින්තූර ඇන්දවීම හෝ නොකළ යුතුය

■ අවශ්‍ය උපදෙස් සඳහා අමතන්න:- සුනේත්‍රා අබේකෝන්  071 - 4034650
(මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු  මධ්‍යස්ථානය)

## දරුවන් සමග ගායනා කළ හැකි කවි නිර්මාණ



**කැතයි කැතයි**
**කැතම කැතයි**
**අරක්කු බොන එක**
**කැතම කැතයි**

**ගඳයි ගඳයි**
**හැම තැනම ගඳයි**
**සිගරට් බිව්වම**
**ගඳම ගඳයි**





**සිගරට් බිව්වම**
**තොල් කැතවෙනවා**
**ඇත්තම ඇත්තයි**
**තොල් කැතවෙනවා**

**ගඳයි ගඳයි**
**ගඳම ගඳයි**
**අරක්කු බිව්වම**
**ගඳම ගඳයි**



**සිගරට් බොන මාමලා**
**අපේ ළඟට ආවොතින්**
**නහය වසා ගනිමු**
**අපි බේරී ඉඳිමු**

**අරක්කු බිව්වම**
**ඇස් කැතවෙනවා**
**ඇත්තම ඇත්තයි**
**ඇස් කැතවෙනවා**



**අරක්කු බිව්වත් සිගරට් බිව්වත්**
**මූණම කැතවෙනවා මූණම කැතවෙනවා**
**පුංචි අපිත් දැන් දන්නවා දන්නවා**
**මූණම කැතවෙනවා මූණම කැතවෙනවා**

**කැතයි කැතයි**
**කැතම කැතයි**
**සිගරට් බොන එක**
**කැතම කැතයි**





## දෙමාපියන්ට මෙම කරුණු පැහැදිලි කරදෙන්න

■ දුම්කොළ සමාගම, මද්‍යසාර සමාගම් හා වෙනත් මත්ද්‍රව්‍ය ජාවාරම් කරුවන් දරුවන් ඉලක්ක කර ඇති නිසා ඉහත සදහන් කවි ගායනය හරහා සිගරට් ,අරක්කු භාවිතය පිළිබඳව ළමුන්ට අසාවක් ඇතිවීම අවම කිරීමට පෙර පාසලෙන් වැඩසටහනක් ආරම්භ කර ඇති බව  දෙමව්පියන්ට  පවසන්න.



■ මෙම වැඩසටහන ක්‍රියාත්මක වන්නේ දරුවන් අරමුණු කරගෙන පමණක් බවත් පියවරුන්ගේ භාවිතයන් වෙනස් කිරීමට නොවන බවත්  දෙමව්පියන්ට පවසන්න.

■ සිගරට් ,අරක්කු,බියර් භාවිතා නොකරන පරිසරයන් තිබෙන නිවෙස්වල දරුවන්ට මෙම වැඩසටහන කරන්න අවශ්‍ය නැතැයි හෝ  සිගරට් ,අරක්කු,බියර් භාවිතා කරන පරිසරයන් තිබෙන නිවෙස්වල දරුවන්ට තමා මෙම වැඩසටහන කළ යුත්තේ යැයි දෙමව්පියන් සිතුවොත් එය වැරදි සිතුවිල්ලකි.

■ දුම්කොළ සමාගම, මද්‍යසාර සමාගම් ඉලක්ක කරන්නේ මේ සියළුම දරුවන් අනාගතයේදි ඔවුන්ගේ නිෂ්පාදනයන්  භාවිතා කරන්නන් බවට පත්කිරීමටයි .